# ○ ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද යනු කුමක්ද

## 1.ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ව්‍යුහය

අදාල වර්ෂයේ එක් නාගරික හා පළාත් පරිපාලන ආයතන පුරෝකථනය කර ඇති වෛද්‍ය වියදම් වලින් රජයේ සහනාධාර සහ රෝහල් ආදියේදී කරන අර්ධ ගාස්තු ගෙවීම අඩුකොට ගෙවීම් කරන මුළු මුදල ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද වේ. මෙය පහත සඳහන් කාණ්ඩ තුනට වෙන් කරනු ලබන අතර, එක් කුටුම්භයකට, ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ප්‍රමාණය තීරණය කිරීම සඳහා සංයෝජනය කෙරේ.

*මෙම සංයෝජනය නාගරික හා පළාත් පරිපාලන ආයතන අනුව වෙනස් වේ.

| | |
|---|---|
| ආදායම් ප්‍රමාණයට සමානුපාතිකව | කුටුම්භ ආදායම අනුව ගණනය කිරීම |
| ඒක පුද්ගල අනුපාතය | කුටුම්භයේ සිටින ග්‍රාහකයන් අනුව ගනණය |
| සමානතා වට්ටම | එක් කුටුම්භයකට කොපමණ මුදලක් ලෙස ගණනය |

*වයස අවුරුදු 40 ත් 64 ත් අතර පුද්ගලයෙකු නම්, හෙද සේවා රක්ෂණ වාරිකයද ඇතුලත්ව බදු ගෙවීම සිදු කරයි.

## 2.ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ගෙවීමේදී සැලකිය යුතු කරුණු

・ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද සෑම මූල්‍ය වසරකම ගණනය කෙරේ.

・එක් කුටුම්භයේ ගෘහ මූලිකයා විසින් ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ගෙවනු ලබයි. (කුටුම්භයේ ගෘහ මූලිකයා රැකියා ස්ථානයේ ජාතික සෞඛ්‍ය රක්ෂණ මගින් ආවරණය වීම සිදු වුවද, ජාතික සෞඛ්‍ය රක්ෂණයෙන් ආවරණය වන ඔහුගේ පවුලේ සාමාජිකයකු සිටී නම්, ප්‍රතිපත්තිමය වශයෙන් එම අදාල සමාජිකයාගේ රක්ෂණ බද්ද ගෘහ මූලිකයා විසින්ම ගෙවිය යුතුයි.)

・ජාතික සෞඛ්‍ය රක්ෂණයට ග්‍රාහකත්වය දැනුම් දීමට ප්‍රමාද වීමක් සිදු වුවද, ග්‍රාහකත්වය පිණිස වන සුදුසුකම ලැබූ මාසය දක්වා ආගමනය කර ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ගෙවිය යුතුය.

・යම් ලෙසකින් තමා වසර මැදදී ජාතික සෞඛ්‍ය රක්ෂණයට ග්‍රාහක වන්නේ නම්, ග්‍රාහක වූ එම මාසයේ සිට ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ගෙවිය යුතුය.

・යම් ලෙසකින් තමා වසර මැදදී ජාතික සෞඛ්‍ය රක්ෂණය නතර කිරීමක් සිදු කරන්නේනම්, එසේ නතර කරන ලද මාසයට පෙර මාසය දක්වා ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ගෙවිය යුතුය.

## 3.ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ගෙවීම් කරන ආකාරය

බදු ගෙවීම් ක්‍රම ලෙස, බදු නිවේදනය හා ගිණුම් මගින් සිදු කරන එකතු කිරීම් (සාමාන්‍ය එකතු කිරීම්) මෙන්ම විශ්‍රාම වැටුප් වලින් එකතු කිරීම (විශේෂ එකතුව) යනුවෙන් දෙවර්ගයක් ඇත. එසේම පහත සඳහන් කොන්දේසි සපුරාලන අය සඳහා විශේෂ එකතුව අදාල වේ.

(1) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය වාර්ෂිකව යෙන් 180,000 හෝ අඩුවෙන් ලබන පුද්ගලයන්

(2) ජාතික සෞඛ්‍ය රක්ෂණ ග්‍රාහක පවුල් සාමාජිකයන් සියළුම දෙනා වයස අවුරුදු 65 ට වඩා වැඩි ජාතික සෞඛ්‍ය රක්ෂණ ග්‍රාහක කුටුම්බ වලට අයත් වීම හා එම කුටුම්භයේ ගෘහ මූලිකයා ජාතික සෞඛ්‍ය රක්ෂණයෙන් ආවරණය වන්නෙකු වීම, එසේම විශ්‍රාම වැටුප් ලබන්නනෙකු වීම

(3) දීර්ඝ කාලීන හෙද සේවා රක්ෂණ වාරික විශේෂ එකතු කිරීම සඳහා සුදුසුකම් ඇති පුද්ගලයින්

(4) දීර්ඝ කාලීන හෙද සේවා රක්ෂණ වාරික සහ ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්දෙහි මුළු මුදල, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ මුදලින් අඩකට සමාන මුදලට වඩා අඩු අය වීම

☆<u>ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ගෙවීමේදී, එම බද්ද ගෙවීම අමතක වීම වලක්වන "ගිණුම් මගින් ගෙවීම" භාවිතා කිරීම පහසු වේ. ක්‍රියා පටිපාටි සඳහා, තම නාගරික පරිපාලනය විසින් අනුමත කරන ලද මූල්‍ය ආයතනය අමතන්න.</u>

## 4.ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ගෙවීම් නොකිරීම

විශේෂිත හේතුවක් නොමැතිව ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ගෙවීම් හිඟ ඇති විටක, තමාට එරෙහිව පහත ක්‍රියාමාර්ග ගනු ලැබේ. ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද <u>අනිවාරයෙන් නියමිත කාලය තුලදී ගෙවමු.</u>

(1) නියමිත බදු ගෙවීම් කාලය ඉක්ම වූ විටක, ගෙවීම් මතක් කිරීමේ දැනුම් දීම කරනු ලබයි.

(2) වසරකට වැඩි කාලයක් බදු හිඟ මුදල් තිබියදී ඔබ වෛද්‍ය ආයතනයකින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නේ නම්, වෛද්‍ය ප්‍රතිකාර වියදම් වල මුළු මුදල (100%) තමා විසින් ගෙවිය යුතු අතර, ඉන්පසුව ග්‍රාහක වී සිටින ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු කාර්ය කවුළුව වෙතට ඉල්ලීමක් කිරීමෙන්, එම රක්ෂණ ප්‍රතිලාභ සඳහා ඔබට මුදල් ආපසු ලැබෙනු ඇත. දීර්ඝ කාලීන හෙද සේවා රක්ෂණය යටතේ 2 වන කාණ්ඩයේ රක්ෂිත පුද්ගලයෙක් සිටී නම්, දීර්ඝ කාලීන හෙද සේවා රක්ෂණ ප්‍රතිලාභ ද සීමා කිරීම්ද කළ හැකිය.

(3) තමාට වසර 1 යි මාස 6 ක හිඟ රක්ෂණ වාරික තිබෙන විටක, තම රක්ෂණ ප්‍රතිලාභ සියල්ල හෝ කොටසක් රඳවා ගැනීමක්ද කරනු ලබයි.

(4) තවදුරටත් හිඟ මුදල් දිගටම පැවතුනහොත්, හිඟ මුදල් රඳවා ලනු ලබන රක්ෂණ ප්‍රතිලාභ මුදලින් අඩු කරනු ලැබේ.

* තම දේපල අත්පත් කර ගැනීමද සිදු විය හැක.

【シンハラ語（Sinhala）】All Rights Reserved Copyright 栃木県国民健康保険団体連合会

## 5.ජපන් භාෂාව නොතේරෙන විටක

නගර සභා හෝ නාගරිකකාර්යාල විමසුම් කවුළු වලදී විදේශ භාෂාවලින් සහාය ලබා දීමට නොහැකි අවස්ථාද ඇති විය හැකිය.
උපදේශන, සහ ක්රියා පටිපාටි සඳහා පැමිණෙන විට, කරුණාකර හැකිතාක් දුරට, ජපන් භාෂාව දන්නා කෙනෙකු සමඟ පැමිණෙන්න




【シンハラ語（Sinhala）】All Rights Reserved Copyright 栃木県国民健康保険団体連合会